# ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) විශේෂ අත්තිකාරම් ගිණුමේ රු.874,426 ක බැර ශේෂයක් දක්වා තිබුණි.

(ආ) අත්හැර දමා ඇති ව්‍යාපෘතියක් වෙනුවෙන් දරා ඇති රු. 43,678,301 ක වටිනාකම 2010 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

#### 1.2.2 නොසැසඳු පාලන ගිණුම්

පහත සඳහන් ගිණුම් විෂයයන් සඳහා සමාලෝචිත වර්ෂයෙ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන හා උපලේඛන ශේෂ අතර රු.10,099,539 ක නොසැසඳීම් නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

| අයිතමය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | උපලේඛන අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| දේශීය මිලට ගැනුම් අත්තිකාරම් | 2,095,947 | 1,576,990 | 518,957 |
| විශේෂ අත්තිකාරම් | 500,677 | 126,250 | 374,427 |
| ආපදා ණය ශේෂය | 14,332,819 | 14,334,480 | 1,661 |

| | | | |
|---|---|---|---|
| ඉන්ධන අත්තිකාරම් | 1,043,537 | 127,500 | 916,037 |
| ණයගැතියෝ | 26,527,190 | 31,935,832 | 5,408,642 |
| බයිසිකල් ණය ශේෂය | 138,375 | 150,250 | 11,875 |
| රඳවා ගැනීමේ බදු | 359,639 | 363,329 | 3,690 |
| රඳවා ගැනීමේ මුදල් | 10,656,622 | 9,930,670 | 725,952 |
| අවලංගු චෙක්පත් | 558,175 | 600,649 | 42,474 |
| මහජන පුද්ගලික හවුල් ව්‍යාපාර ආදායම | 3,790,407 | 1,694,583 | 2,095,824 |
| | | | 10,099,539 |

### 1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට වර්ෂය ඉක්මවූ වෙළෙඳ ණයගැති ශේෂය රු.6,284,782 වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට මහජන පුද්ගලික හවුල් ව්‍යාපාර යටතේ ලැබීමට ඇති මුළු ණය ප්‍රමාණය රු.3,790,407 ක් වූ අතර එහි 2008 වර්ෂයේ සිට ලැබීමට ඇති රු.1,506,778 ක හිඟ මුදලක්ද ඇතුලත් වී තිබුණි.

(ඇ) 2011 දෙසැම්බර් 31 දිනට අවලංගු කළ චෙක්පත් ගිණුමේ ශේෂය රු.558,175 ක් වු අතර එය නිරවුල් කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

### 1.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| නීති,රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ 104 | වාහන අනතුරු 47 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබු අතර එම වාහන අනතුරුවල මුළු හානි වටිනාකම රු.2,566,702 ක් වී තිබුණි. |

(ii) මු.රෙ. 262 (1) — ගෙවීම් කළ දිනය යටතේ සියලුම ගෙවීම් ගිණුම්ගත කළයුතු වුවද විදේශ ගමන් සඳහා අවස්ථා 3 කදී ලබාදී තිබුණු රු.384,056 ක අත්තිකාරම් මුදල් මාස 3 ක් ප්‍රමාද වී මුදල් පොතේ සටහන් කර තිබුණි.

(iii) මු.රෙ. 271 (2) (අ) — වැටුප් ගෙවීම ආරම්භවී දින 14 ක් ඇතුළත නොගෙවූ වැටුප් ආදායමට බැර කළ යුතු වුවත්, 1999 සිට 2010 දක්වා වූ නොගෙවූ වැටුප් රු.48,947 ක් ආදායමට ගැනමට කටයුතු කර නොතිබුණි.

(iv) මු.රෙ.371(2) (ආ) — තත්කාර්ය අතුරු අග්‍රිමයක් සඳහා එක් අවස්ථාවකදී රු.20,000 ක මුදලක් ලබාගත හැකි වුවද අවස්ථා 26 කදී අදාළ සීමාව ඉක්මවා රු.1,249,877 ක මුදලක් අත්තිකාරම් ලෙස ලබාදී තිබුණි.

(v) මු.රෙ.387 — ආණ්ඩුවේ බැංකු ගිණුමකින් අයිරා ලබාගැනීම තහනම් වුවත් සමාලෝචිත වර්ෂයේදී බැංකු අයිරා ලබා ගැනීම හේතුකොටගෙන අයිරා පොළී වශයෙන් රු.5,925 ක් ගෙවා තිබුණි.

(vi) මු.රෙ. 394 (ඇ) — අධිකාරිය සතු රු.2,584,873 ක් වටිනා අවලංගු කල චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(vii) මු.රෙ 396 (2) (ඈ) — වටිනාකම රු.517,660 ක් වූ මාස 6 ඉක්මවූ චෙක්පත් 30 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

| | |
|---|---|
| (viii) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක බීඑම්එස්/ඊ/4/50/5/297/1-1 හා 2010 නොවැම්බර් 23 දිනැති ලිපිය | බඳවා ගැනීමේ පරිපාටියේ සංශෝධනයක් අවශ්‍ය වුවහොත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු බවත් එසේ නොකර කිසිදු සංශෝධනයක් නොකළ යුතු බව සඳහන් කර තිබියදීත් අනුමැතියකින් තොරව උසස්වීම් ලබාදී තිබුණි. මේ සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින බව සභාපතිවරයා දැනුම්දී ඇත. |
| (ix) භාණ්ඩාගාර චක්‍රලේඛ අංක අයිඒඅයි/2002/02 හා 2002 නොවැම්බර් 28 දිනැති චක්‍රලේඛය | අධිකාරය සතුව පරිගණක හා පරිගණක උපාංගවල වටිනාකම රු.2,631,812 ක් වුවත් ඉහත චක්‍රලේඛයේ 2 ඡේදය පරිදි පරිගණක උපාංග හා මෘදුකාංග සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.23,851,808 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.25,249,109 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,397,301 ක ඌනතාවයේ අඩුවීමක් පෙනනුම්කර ඇත. ඌනතාවය අඩුවීම ප්‍රතිශතයක් ලෙස 6% කි. මේ සඳහා ප්‍රධාන වශයෙන් ආදායම වැඩිවීම හා බෙදාහැරීමේ වියදම අඩුවීම හේතුවී තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද ගිණුම් අනුව 2011 දෙසැම්බර් 31 දිනට ආයතනයේ මූල්‍ය ව්‍යුහය 2010 දෙසැම්බර් 31 දිනට පැවති තත්වය හා සසඳා පහත දක්වා ඇත.

| සම්පත් | දෙසැම්බර් 31 දිනට 2011 | 2010 | වෙනස්වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|
| | (රු.000) | (රු.000) | % |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන | 119,042 | 99,431 | 20 |
| රදවාගත් ඉපයීම් | (124,163) | (98,840) | 26 |
| | (5,120) | 591 | |
| ජංගම නොවන වගකීම් | 796,961 | 799,213 | (0.28) |
| ජංගම වගකීම් | 50,731 | 19,554 | 159 |
| උපයෝජනය | | | |
| ජංගම නොවන වත්කම් | 759,401 | 750,617 | 01 |
| ජංගම වත්කම් | 83,171 | 68,742 | 21 |
| | 842,572 | 819,359 | |

පහත සදහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) යම් ආයතනයක සම්මත ජංගම වත්කම් හා ජංගම වගකීම් අතර අනුපාතය 2:1 විය යුතු වුවත්, අධිකාරියේ ජංගම වත්කම් හා වගකීම් අතර අනුපාතය 1.6:1 ක් වී තිබුණි.

(ආ) රදවාගත් ඉපයීම්වල වෙනස්වීමේ ප්‍රතිශතය 2010 ට සාපේක්ෂව 2011 වර්ෂයේදී 26% ක අවාසි සහගත තත්වයක් පෙන්නුම් කර තිබුණි.

## 2.3 වියදම්වල වැඩිවීම

2011 වර්ෂය වෙනුවෙන් එක් එක් වියදම් සදහා අයවැය මගින් වෙන්කරන ලද වටිනාකම ඉක්මවා වියදම් දරා තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර 7% සිට 129% දක්වා වූ වෙනසක් නිරීක්ෂණය වූයෙන්, අවශ්‍ය අරමුණු ඉටුකර ගැනීමට හැකිවන පරිදි අයවැය පාලනය යථාවත් කිරීම කෙරෙහි අවධානය යොමු නොවීම නිසා පාලන උපකරණයක් ලෙස යොදා ගැනීමට අපොහොසත්වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

2009 2010 හා 2011 වර්ෂවල මිරිදිය හා කිවුල්දිය මත්ස්‍ය නිෂ්පාදනය පහත පරිදි වේ.

| වර්ෂය | කිවුල්දිය මත්ස්‍ය නිෂ්පාදනය | මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය |
|---|---|---|
| | මෙ.ටොන්. | මෙ.ටොන්. |
| 2009 | 293,170 | 46,560 |
| 2010 | 330,240 | 51,390 |
| 2011 | 381,260 | 59,560 |

2010 ට සාපේක්ෂව 2011 වර්ෂයේ කිවුල්දිය මත්ස්‍ය නිෂ්පාදනයේ වර්ධනය 15% වන අතර මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනයේ වර්ධනය 16% කි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) අධිකාරියේ නිලධාරීන්ගේ නිර්දේශ මත මත්ස්‍ය බීජ නෂ්පාදන ණය පදනම මත වගාකරුවන්ට අලෙවි කරනු ලබන අතර, 2011 පෙබරවාරි 28 දින වන විට අයවීමට ඇති ණය ශේෂය රු.29,372,125 කි. ණය ශේෂය වාර්ෂිකව ඉහල යාමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය වන බැවින් ණය නැවත අයකර ගැනීමේ සක්‍රීය ක්‍රියාවලියක් ආයතනය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) (i) අධිකාරිය සතුව ඇති කහදමෝදර අභිජනන මධ්‍යස්ථානය විධිමත් පරිදි පවරා ගැනීමක් සිදුකර නොතිබුණි.

(ii) අධිකාරිය සතු ව්‍යාප්ති කාර්යාල හා අභිජනන මධ්‍යස්ථාන 6 ක් සමාලෝචිත වර්ෂය අවසානය තෙක් විධිමත්ව පවරා ගැනීමක් සිදුකර නොතිබුණි.

(ඇ) නියැදි පරීක්ෂණයේදී අනාවරණය වූ පරිදි 2011 ජනවාරි හා පෙබරවාරි මාසවලදී අනුමත කිරීමකින් තොරව රු.957,254 ක් වටිනා වවුචර් 23 ක් හා සහතික කිරීමකින් තොරව රු.95,399 ක් වටිනා වවුචර් 10 ක් සඳහා ගෙවීම්කර තිබුණි.

(ඈ) අධිකාරිය විසින් මත්ස්‍ය බීජ නිෂ්පාදන සංවිධාන 25 ක් වෙත ඇඟිල්ලන් නිෂ්පාදනය කිරීම සඳහා ණය පදනමට ඇසිත්තන් ලබාදී තිබු අතර, 2011 දෙසැම්බර් 31 දින වන විට එම සංවිධානවලින් අයවීමට තිබු මුළු ණය මුදල රු.2,376,642 ක් වී තිබුණි. 2012 වර්ෂය අවසානය වනවිට අත්පිට මුදලට පමණක් ඇසිත්තන් නිකුත් කිරීමට කටයුතු කරන බව සභාපතිවරයා දැනුම්දී ඇත.

(ඉ) අංක 43-1203 රථයේ ධාවන සටහනට අදාලව දෛනිකව ඉන්ධන තුලනය කිරීමේදී ලොග් පොත් අනුව ටැංකි ධාරිතාවය ලීටර් 80 ක් වුවත් එම ධාරිතාවය ඉක්මවා අවස්ථා 156 කදී ඉන්ධන ලීටර් 5,674 ක් ඉතිරිව තිබෙන ඉන්ධන ලෙස දක්වා තිබූ අතර, වටිනාකම රු.15,258 ක් වී තිබුණි.

## 3.3 හදුනාගත් පාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) අධිකාරිය විසින් ආරක්ෂක සේවා සැපයීමට අදාල ආයතනය ලෙස ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව තෝරා ගැනීම හේතුකොටගෙන අධිකාරියට වාර්ෂිකව දැරීමට සිදුවන ආරක්ෂක වියදම රු. මිලියන 15.358 කි. එම සේවය ලබාගැනීමට නාගරික සංවර්ධන අධිකාරිය හෝ වෙනත් පෞද්ගලික ආරක්ෂක සේවා සපයන ආයතනයක් තෝරාගන්නේ නම් දැරීමට සිදුවන උපරිම ආරක්ෂක වියදම රු.මිලියන 10 කි. එම නිසා ආරක්ෂක සේවය වෙනුවෙන් අධිකාරියට වාර්ෂිකව දැරීමට සිදුවන අතිරේක වියදම රු.මිලියන 5 ක් ඉක්ම වී තිබුණි.

(ආ) අංක 65-1442 දරන මිට්ෂුබිෂි ඉන්ටකූලර් රථය අධිකාරිය විසින් රු.2,587,500 ක මුදලකට 2000 වර්ෂයේදී මිලදීගෙන තිබුණි. එම රථය 2010 සැප්තැම්බර් සිට ධීවර හා ජලජ සම්පත් නියෝජ්‍ය ඇමතිතුමාගේ පෞද්ගලික ලේකම් වෙත මුදාහැර තිබුණු අතර ඒ සඳහා 2010 හා 2011 වර්ෂවල රක්ෂණය කිරීම සඳහා රු.76,828 ක මුදලක්ද ආදායම් බලපත්‍ර ලබාගැනීම සඳහා රු.5,400 ක මුදලක්ද අධිකාරිය විසින් දරා තිබුණි.

(ඇ) කුඩා පරිමාණ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක ( Mini Hatchery ) ස්ථාපනය කිරීමේ වැඩසටහන යටතේ අධිකාරිය මගින් මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක 25 තැනීම සඳහා දරන ලද මුලික පිරිවැය රු.11,094,329 ක් විය. එම මුදල් නිෂ්පාදන ඒකකවලින් පොලී රහිතව සමාන වාරික 60 කින් අවුරුදු 5 ක් ඇතුළත අයකළ යුතු වුවත් , 2012 ජූලි වනවිට අයකරගෙන නොතිබූ වාරිකවල වටිනාකම රු.4,006,533 ක් වී තිබුණි.

### 3.4 නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) වර්ෂයකට වැඩි කාලයක සිට අළුත්වැඩියා කළයුතු තත්ත්වයේ පවතින මෝටර් සයිකල් 11 අළුත්වැඩියාවෙන් තොරව භාවිතයෙන් ඉවත්කර තිබුණි.

(ආ) ඉස්සන් වගා කිරීමේ මධ්‍යස්ථාන කටයුතු වෙනුවෙන් වෙන්කොට ඇති යතුරු පැදි 07 ක් වර්ෂයකට වැඩි කාලයක සිට භාවිතයට ගෙන නොතිබුණි.

## 4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) අභ්‍යන්තර විගණනයේ රාජකාරි හා වගකීම් කරගෙන යාම සම්බන්ධයෙන් ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පත්කර නොතිබූ අතර, කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ පටිපාටියද අනුමත කර ගෙන නොතිබුණි.

(ආ) කාර්ය මණ්ඩලයේ එක් නිලධාරියෙකු පමණක් සිටීම හේතුවෙන් අභ්‍යන්තර විගණන අංශයේ වගකීම් අවශ්‍යතාවය අනුව සැලසුම් කිරීමට හා විගණන කටයුතු කරගෙන යාමට නොහැකි වී තිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අවධානය සඳහා යොමුකරන ලදී.පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමුකල යුතුවේ.

(අ) ණයගැතියන්
(ආ) ආදායම්
(ඇ) ණය හිමියන්
(ඈ) වාහන පාලනය
(ඉ) අත්තිකාරම්
(ඊ) මත්ස්‍ය නිෂ්පාදනය